# පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
ශ්‍රී ලංකාව
2019

# පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
ශ්‍රී ලංකාව
2019

# පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

සැප්තැම්බර් 2019

කර්තෘ : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ,
ශ්‍රී ලංකාව

දුරකථන : +94 11 281 5703

ෆැක්ස් : +94 11 281 6178

විද්‍යුත් තැපැල : secnec@slt.lk

වෙබ් අඩවිය : www.nec.gov.lk

ISBN : 978-955-9448-53-2

තීරු සංකේතය :

9 789559 448532

# පටුන


පෙරවදන v

උපකාරානුස්මෘතිය vi

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ උපුටනයන් vii

පූර්විකාව xi

1. හැඳින්වීම 1

 1.1 ජාතික සංදර්භය තුළ පෙර පාසල් අධ්‍යාපනය 3

 1.2 ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ කාලීන ගැටලු 4

2. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 8

 2.1 ජාතික ප්‍රතිපත්තියෙහි අභිමතාර්ථ හා මෙහෙයවීමේ මූලධර්ම 8

 2.2 දැක්ම හා මෙහෙවර 11

 2.3 සුවිශේෂී අරමුණු 12

3. ක්‍රියාමාර්ග ගනු ලබන ක්ෂේත්‍ර 13

 3.1 පෙර පාසල් අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශය 13

 3.2 පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය 14

 3.3 පෙර පාසල් අධ්‍යාපනයට අදාළ ශ්‍රම බලකායෙහි සංවර්ධනය 15

 3.4 දෙමව්පියන්, පවුල හා ප්‍රජාවගේ සහභාගිත්වය 16

 3.5 දත්ත, පර්යේෂණ, ඇගයීම හා ලේඛනගත කිරීම 17

 3.6 පෙර පාසල් අධ්‍යාපනය පාලනය සහ මූල්‍ය සම්පත් භාවිතය 18

4. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව 20

 ඇමුණුම් 23

ඇමුණුම 1 : පාරිභාෂික පද මාලාව හා අර්ථ දැක්වීම් 23

ඇමුණුම 2 : ජාතික පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම 25

ඇමුණුම 3 : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින් 27

ඇමුණුම 4 : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයන් 28

# පෙරවදන

මේ වන විට ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තියක් එළි දක්වා නැත. පෙර පාසල් නාමකරණය පවා පුළුල් ලෙස වෙනස් වෙයි. උදාහරණයක් ලෙස, බාලාංශ, පෙර පාසල්, ළදරු පාසල්, ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ මොන්ටිසෝරි වැනි විවිධ යෙදුම් භාවිත වන බව සඳහන් කළ හැක. උපදේශන මාධ්‍ය මෙන්ම ප්‍රමිතීන් ද ආයතනයෙන් ආයතනයට වෙනස් වෙයි.

මෙම සන්දර්භය තුළ, 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ අධ්‍යාපනයේ සියලු අංශ පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ප්‍රධාන වගකීම ඇති ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස සලකා ඇත.

අදාළ සියලු පාර්ශවයන්ගෙන් උපදෙස් ලබා ගෙන සකස් කරන ලද මෙම ප්‍රතිපත්ති ලේඛනය ප්‍රකාශයට පත් කිරීමට පෙර සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

උප සභාපති (ප්‍රතිපත්ති) ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතාගේ විශේෂ මග පෙන්වීම යටතේ ජාතික ප්‍රතිපත්ති සකස් කළ කණ්ඩායමට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමි.

**මහාචාර්ය ඩබ්ලිව්. අයි. සිරිවීර**
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2019.09.17

# උපකාරානුස්මෘති

ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය කාලීනව සකස් කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තියේ මඟ පෙන්වීමකින් තොරව ඉදිරියට ගොස් තිබේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ නිරත සියලුම ආයතන හා සංවිධානවල වර්තමාන පර්යේෂණ හා උපදේශන මත පදනම් වී ඇත. පෙර පාසල් අධ්‍යාපනය ඇත්තේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ සන්දර්භය තුළ හෙයින්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ළමා ලේකම් කාර්යාලය සහ සියලුම පළාත්වල පෙර පාසල් අධ්‍යාපනය භාර අධ්‍යක්ෂවරුන් සමඟ ඉතා සමීපව හා ඒකාබද්ධව කටයුතු කරන ලදී.

මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා දායක වූ සියලු දෙනාට සහ විශේෂයෙන් සභාපති, උප සභාපති (සැලසුම්), කොමිෂන් සභාවේ සාමාජිකයින්, සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය වෙත මාගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

ප්‍රවීණ උපදේශකයින් දෙදෙනෙකු වන මහාචාර්ය එල්සි කොතලාවල සහ ආචාර්ය ඉන්ද්‍රානි තලගල විසින් සපයන ලද මග පෙන්වීම සහ ව්‍යාපෘතියේ කොටසක් සඳහා යුනිසෙෆ් ආයතනය මඟින් දක්වන ලද මූල්‍යමය අනුග්‍රහය මම හෘදයාංගමව අගය කර සිටිමි.

**ආචාර්ය ජී. බී. ගුණවර්ධන**

උප සභාපති (ප්‍රතිපත්ති)

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

# 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ උපුටනයන්.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා එහි කර්තව්‍ය**

(1) කොමිෂන් සභාවේ කර්තව්‍ය

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම හෝ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිතුමන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස් වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දක්වීමේ අදහස ඇතිව, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිතුමන්ට නිර්දේශ කිරීම;

(ඇ) උපදෙස් සඳහා ජනාධිපතිතුමන් විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් දීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණාවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිතුමන් වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකිය:-

(අ) සේවා නියුක්තිවලට, කර්මාන්තවලට හා සාමාජික අවශ්‍යතාවලට සරිලන පරිදි අධ්‍යාපනය සකස් කිරීමෙහිලා අවශ්‍ය වන, අධ්‍යාපනික ආයතනවල විෂයමාලාව හා ඉගැන්වීම් ක්‍රමවල ඇති කළයුතු වෙනස්කම්;

(ආ) අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ස්වශක්තිය පූර්ණාකාරයෙන් වැඩි දියුණු කරගැනීමට හැකිවන පරිදි, ලබාදිය යුතු මාර්ගෝපදේශකත්වයේ හා උපදේශ සේවාවල ප්‍රමාණවත් භාවය;

(ඇ) අධ්‍යාපනික ආයතන හා ප්‍රජාව අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමෙහි ලා අවශ්‍ය වැඩ පිළිවෙළවල්;

(ඈ) ප්‍රජාවේ සමස්ත මානුෂික සංවර්ධනය උදෙසා අධ්‍යාපනික ආයතන, සම්පත් මධ්‍යස්ථාන වශයෙන් වැඩි දියුණු කිරීම;

(ඉ) ප්‍රාදේශීය වශයෙන් පාසල් අතර පවත්නා අතුල්‍යතා අඩු කිරීම සඳහා අවශ්‍ය පියවර;

(ඊ) ගුරුවරුන් සහ අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලයේ වෘත්තීය තත්ත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර;

(උ) ප්‍රාථමික හා ද්විතීයික පාසල් නියමිත කාලයට පෙර හැර යන ළමයින්ට, ඔවුන්ගේ ශක්‍යතාව පූර්ණාකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා සැලැස්විය හැකි විකල්ප වැඩසටහන්;

(ඌ) සියලු ජන කොටස්වල සහ ආගම්වල ශිෂ්‍යයින්ගේ සංස්කෘතික හා ආගමික අපේක්ෂාවන් පෝෂණය කිරීමෙහි ලා අවශ්‍ය වන විෂයමාලාවල ඇති කළ යුතු වෙනස්කම්;

(එ) එවැනි යම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය නීතිමය වෙනස්කම්.

## ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට පහත දැක්වෙන කාරණා ඇතුළත් වේ.

අධ්‍යාපනයේ පරමාර්ථ හා නිෂ්ඨාවන්; පෙර පාසල්, ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික, උසස්, නොවිධිමත්, අවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තීය හා ආගමික යන අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය; ශිෂ්‍යයින් ඇතුළත් කරගැනීම හා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ක්‍රම හා නිර්නායක ඇතුළුව අධ්‍යාපන ආයතනවල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය; ඉගැන්වීමේ මාධ්‍යය, විෂයමාලා විවිධාංගීකරණය, පෙළ පොත් සහ ඉගෙනුම් උපකරණ, ආගමික දැනුම, පිළිපැදීම හා පරිචය ලබන ස්ථානය, තක්සේරු කිරීම හා ඇගයීම, විභාග ක්‍රමය, සහතික, අභිඥාන පත්‍ර සහ ශාස්ත්‍රීය ප්‍රදාන හා සුදුසුකම් පිළිගැනීම, ගුරුවරුන්, උපකාරක අධ්‍යාපන කාර්ය මණ්ඩලය, අධීක්ෂකයින් සහ පරිපාලකයින් ඇතුළුව අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාපනය කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ වෘත්තීය වර්ධනය; ප්‍රජා සහභාගීත්වය උපයෝගී කර ගැනීමද ඇතුළුව අධ්‍යාපනය සඳහා වූ සම්පත්; සහ දිවා ආහාරය, සෞඛ්‍ය හා දන්ත සේවා, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ඇතුළුව ඉගෙනීම සඳහා වූ උපකාරක සේවා.

කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරන තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල, හැකියාවක් දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලැබිය යුතු වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත්කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවට පූර්ණ කාලීනව සේවය කළ යුතුය.

# පූර්විකාව

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය, පෙර පාසල් අධ්‍යාපන පද්ධතිය සඳහා දිගු කාලීන දැක්මක් ඉදිරිපත් කරන අතර, පුළුල් සමාජ වෙනසක් තුළ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන කාර්යයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් හා මෙරට පෙර පාසල් අධ්‍යාපන පද්ධතියේ පරාමිතීන්, ඊට භාවිත කරන පද හා සංරචක පැහැදිලි කරමින්, ප්‍රවේශය වර්ධනය කිරීම, ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, දෙමව්පියන් සහ පවුල් සම්බන්ධ කර ගැනීම, දත්ත පදනම් කර ගැනීම, මූල්‍ය හා පිරිස් කළමනාකරණය සහ ජාතික හා පළාත් මට්ටමේ නායකත්වය පාලනය හා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම අරමුණු කර ගත් ව්‍යුහයක් ද ඉදිරිපත් කරයි.

# 1. හැඳින්වීම



ළමයාගේ ජීවිතයේ මුල් වසර කිහිපය තම ජීවිතය පුරා පවතින ප්‍රගතියට පදනම සපයයි. යහපත් සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයක් ද, සුරක්ෂිත හා ප්‍රතිචාරාත්මක ගෘහ පරිසරය හා මුල් අවධියේ සිට ඉගෙනුමට අවස්ථා ද හිමි වේ නම්, ළමයි වර්ධනය වෙමින් සහ ඉගෙන ගනිමින් සාර්ථකත්වයට පත් වෙති. උසස් තත්ත්වයේ මුල් ළමාවිය වැඩසටහන්වලට ළමයින්ගේ ජීවිත වෙනස් කිරීමේ හැකියාව ඇති බව ද, ඔවුන්ට වඩාත් යහපත් වූ සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රතිඵලවල ප්‍රතිලාභ භුක්ති විඳිය හැකි බව ද, ඔවුන් වැඩිහිටියන් බවට පත් වූ පසු අපරාධ අඩු වීම හා පුද්ගල ඉපයීම් ඉහළ යාම සිදු වන බව ද ප්‍රමුඛ පෙළේ ආර්ථික විද්‍යාඥයින්ගේ පිළිගැනීම වේ.

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ 'මුල් ළමාවිය' යන පදය නිර්වචනය කර ඇත්තේ 'මව් කුස පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු පහ දක්වා වූ කාලය' වශයෙනි.[1] මෙම අවධිය ළමයින් වැඩෙන පරිසරය හා ඔවුන් වටා සිටින පුද්ගලයින් යන දෙපාර්ශවයේ ම බල පෑමට ලක්වන්නා වූ ළමයාගේ මොළයේ චමත්කාරජනක වර්ධනයක් සිදු වන අවධියක් වශයෙන් විශේෂිත ය. එම නිසා, ජීවිතයේ මුල් කාලයේ ළමයින් ලබන අත්දැකීම්වල ගුණාත්මක බව ද, ඔවුන්ගේ මොළයේ සැකැස්මේ වර්ධනය ද අතර දැඩි සහසම්බන්ධතාවක් පවතී. ඒ සඳහා ළමයින්ට තමා ආදරයෙන් රැක බලා ගන්නා දෙමව්පියන් හා රැකවරණය සපයන්නන් තුළින් සහ වයසින් වැඩෙත් ම තමන්ගේ පෙර පාසලේ ගුරුවරුන් සමග ද ප්‍රතිචාරාත්මක අන්තර්ක්‍රියා හරහා, උචිත වූ ඔවුන්ගේ වර්ධනය ප්‍රවර්ධනය කෙරෙන්නාවූ මුල් කාලීන අත්දැකීම් ලබා ගැනීම වැදගත් වේ.

පෙර පාසල් අධ්‍යාපනය හෝ මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා අවම වශයෙන් එක් වසරක් හෝ සහභාගි වූ ළමයින්ට පාසල තුළ සාර්ථක වීමට අවශ්‍ය තීරණාත්මක කුසලතා සංවර්ධනය කර ගැනීමේ වැඩි සම්භාවිතාවක් ඇති හෙයින් ද, එක ම ශ්‍රේණියේ රැඳී සිටීමට හෝ පාසලින් ඇද හැලීමට හෝ ඊට වඩා අඩු සම්භාවිතාවක් ඇති හෙයින් ද, වැඩිහිටියන් බවට පත් වූ පසු සාමකාමී සෞභාග්‍යමත් සමාජයක් මෙන්ම ආර්ථිකයක් සඳහා ද දායක වීමට ඔවුන්ට වැඩි හැකියාවක් ඇති බව පර්යේෂණ අනාවරණය කරයි.[2] එමෙන් ම, උසස් තත්ත්වයේ ගුණාත්මක බවින් යුතු මුල් ළමාවිය සේවා සඳහා කෙරෙන ආයෝජන දිගු කාලීන ව හානිපූරක සේවා සඳහා කරනු ලබන අධික පිරිවැය ඉතිරි කරන්නේ ය යන මතය දත්ත මගින් නිසැක ව ම සනාථ කර ඇත.[3] එම නිසා කුඩා ළමයින් සඳහා කෙරෙන ආයෝජන, රටක සංවර්ධනය සඳහා පිරිවැය, ඵලදායී ළමා සාධනයට හිතකර වූ ප්‍රබල සාධකයකි. පෙර පාසල් අධ්‍යාපනය සඳහා සර්ව සාධාරණ ප්‍රතිපාදන ලබා දීම සියලු ම ළමයින් සඳහා සමාන අවස්ථා ලබා දීමේ පදනම ලෙස බොහෝ විට සංකල්පනය කෙරේ.

---

1 *Sri Lanka, Ministry of Women and Child Affairs and Dry Zone Development, National Early Childhood Care and Development Policy (Colombo, 2019).*

2 *United Nations Children's Fund, A World Ready to Learn: Prioritizing quality early childhood education (New York, UNICEF, 2019).*

3 *Jorge Luis García, James J. Heckman, Duncan Ermini Leaf and María José Prados, "Quantifying the Life-Cycle Benefits of a Prototypical Early Childhood Program", NBER Working Paper No. w23479 (Cambridge, Massachusetts, National Bureau of Economic Affairs, 2017).*

මෙම කරුණු හේතුවෙන් බහු ජාතික සංවිධාන විසින් ලෝකය පුරා මුල් ළමාවිය අධ්‍යාපනයේ උන්නතියට උර දෙනු පිණිස ප්‍රධාන ලේඛනයන් සංවර්ධනය කිරීම හරහා ප්‍රබල උත්සාහයන් දරා ඇත.[4] ශ්‍රී ලංකාව, අධ්‍යාපනයට උර දෙන මූලික ජාත්‍යන්තර නෛතික ලේඛන, නිර්දේශ, ප්‍රකාශ හා රාමු ගණනාවක පාර්ශ්වකරුවකු වන බැවින්, ඔවුන්ගේ අරමුණු, විශේෂයෙන් පෙර පාසල් ළමයින් ඇතුළු සියලුම ළමයින්ගේ අධ්‍යාපනයට ඇති අයිතිය පිළිබඳ අරමුණු අභිවර්ධනය කරීමට බැඳී සිටියි.

සම අවස්ථා සැපයීම මත පදනම් ව අධ්‍යාපනය සෑම ළමයකුගේ ම නීත්‍යානුකූල අයිතියක් බව 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුති පිළිගැනීම මෙහි දී සැලකිල්ලට ගත යුතු ඉතා වැදගත් කරුණකි. එහි සාමාන්‍ය විවරණ අංක 1 (General Comment No. 1, 2001) ලේඛනයේ අධ්‍යාපනයේ ඉලක්කය ලෙස "ළමයාගේ කුසලතා, ඉගෙනුම සහ වෙනත් හැකියා, මානව අභිමානය, ස්ව සංකල්පය හා ආත්ම විශ්වාසය සංවර්ධනය කරමින් බල ගැන්වීම" බව පැහැදිලි කරමින් අධ්‍යාපනය තුළින් ළමා කේන්ද්‍රීය, ළමා මිතුරු හා ළමා අයිතීන් මෙන් ම ළමයාගේ සහජ අභිමානය ද පිළිඹිබු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සාමාන්‍ය විවරණ අංක 7 (2005) මුල් ළමාවිය සඳහා ළමා අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම යන ලේඛනයේ මුල් ළමාවියේ අධ්‍යාපනයට ඇති අයිතිය අර්ථකථනය කර ඇත්තේ උපතේ දී ආරම්භ වී ළමයින්ගේ උපරිම සංවර්ධනයට ඇති අයිතිය හා සමීප ව බැඳුණක් ලෙසිනි. කිසිදු ආකාරයකින් වෙනස් කොට නො සලකා ළමයාගේ පෞරුෂයේ, සහජ දක්ෂතාවන්ගේ සහ මානසික හා කායික හැකියාවන්ගේ පූර්ණ විභවතාව ළඟා කර ගත හැකි පරිදි සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනය යොමු කරන ලෙස එය රාජ්‍ය පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටී. සැමට අධ්‍යාපනය විශ්ව ප්‍රකාශනයේ "අධ්‍යාපනයේ ප්‍රතිලාභ **සෑම සමාජයකට ම අයත් සෑම පුරවැසියකුට** ම ලබා දීම සඳහා" යන දැක්ම යළි ස්ථිර කරමින් "සැමට අධ්‍යාපනය : අපගේ සාමූහික කැපවීම් ඉටු කර ගැනීම" යටතේ ලෝක අධ්‍යාපන සංසදය (2000) සම්මත කර ගත් ඩාකාර් ක්‍රියාකාරී රාමුව එහි පළමු වන ඉලක්කය වශයෙන් විශේෂයෙන් අවදානම් හා අවාසිදායක තත්ත්වයේ පසු වන ළමයින් සඳහා පුළුල් ලෙස මුල් ළමාවිය රැකවරණය හා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමට හා වැඩි දියුණු කිරීමට කැප වී සිටී. මෙම එක් එක් අධ්‍යාපන ඉලක්කය සපුරා ගැනීමේ දී රටක් දක්වන සමස්ත ප්‍රගතිය එම ඉලක්කය සපුරා ගැනීමේ වේගය සමඟ නිසගයෙන් ම බැඳී පවතී.

ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (2006) 24 වන වගන්තිය ද ආබාධිත පුද්ගලයින්ගේ අධ්‍යාපනයට ඇති අයිතිය සුරකිමින් අන්තර්කරණ අධ්‍යාපනයට ඇති අයිතිය නිල වශයෙන් ප්‍රකාශයට පත් කර, ඒ වෙනුවෙන් ගත යුතු පියවර නිර්දේශ කරයි. මෙම වගන්තිය පෙර පාසල් වයසේ පසුවන ළමයින්ට ද අදාළ වේ. ආබාධිත ළමයින්ට වෙනස් කොට නො සැලකිය යුතු බව පමණක් නො ව ඔවුන්ට සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට සහභාගි වීමට හැකි විය යුතු බව ද මෙම වගන්තියෙන් විධාන කොට ඇත. එමෙන් ම සියලුම ආකාරයේ දරිද්‍රතාවන් අවසන් කිරීමේ හා විශ්වීය සැලසුමේ මුල් පිටපත ලෙස සැලකිය හැකි, සැමට වඩාත් යහපත් වඩාත් ස්ථිරසාර අනාගතයක් සාධනය කර ගැනීමේ නව ගෝලීය න්‍යාය පත්‍රය එනම් 2016 "ස්ථිරසාර සංවර්ධන ඉලක්ක" සිය 4 වන ඉලක්කය මගින් ජාත්‍යන්තර ප්‍රජාව අවධානය යොමු කරන ලද සැමට අන්තර්කරණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ යාව ජීව ඉගෙනුම සඳහා අවස්ථා ප්‍රවර්ධනය කිරීම යළි ස්ථිර කර තිබේ. වර්ෂ 2030 වන විට ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම් වන පරිදි සියලුම ගැහැනු ළමයින්ට හා පිරිමි ළමයින්ට ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධනයට, රැකවරණයට හා පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශය සහතික කරන ලෙස මෙම ඉලක්කයේ 4.2 අරමුණ මගින් දේශ දේශයන්ගෙන් ඉල්ලා ඇත.

4 *United Nations Educational, Scientific and Cultural Organization and Right to Education Initiative, Right to education handbook (France, UNESCO, 2019).*

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් මගින් ''ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සමාජයීය වශයෙන් පූර්ණ වර්ධනයට පත් වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකි වන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතු ව වර්ධනය කළ යුත්තේ ය'' යනුවෙන් ප්‍රකාශ කෙරේ.

ජාත්‍යන්තර හා ජාතික ලේඛනවල අන්තර්ගත ව ඇති මෙම අයිතිවාසිකම් හා ඉලක්ක සාක්ෂාත්කරණය කර ගැනීම සඳහා, පෙර පාසල් අධ්‍යාපනයට ඇතුළත් වීම වර්ධනය කිරීමෙන්, එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමෙන් හා ශූර ලෙස මුදල් යෙදවීමෙන් පෙර පාසල් අංශය කළමනාකරණය කිරීමට වේගවත් හා ප්‍රගතිශීලී වූ, එක් ව සැලසුම් කරන ලද ප්‍රයත්නයක් අවශ්‍ය වේ.

## 1.1 ජාතික සංදර්භය තුළ පෙර පාසල් අධ්‍යාපනය

වර්ෂ 1979 ස්ථාපිත කරන ලද ළමා ලේකම් කාර්යාලය, ළමා කටයුතු සම්බන්ධ ජාතික අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත කාර්යාලය ලෙස මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රමවත් ව සකස් කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ඇගයීම පිළිබඳ වගකීම දරයි. මව්කුස පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු පහ දක්වා වූ ළමයින්ගේ සාකල්‍ය සංවර්ධනය අරමුණු කර ගත් ප්‍රථම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය වූ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2004 වර්ෂයේ දී ළමා ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇත. වර්ෂ 2019 දී සංශෝධනය කරන ලද ජාතික ප්‍රතිපත්තිය කුඩා ළමයින් සඳහා පුළුල් හා සමෝධානිත මුල් ළමාවිය වැඩසටහන්වල වැදගත්කම හඳුනා ගනිමින් පෙර පාසල් අධ්‍යාපනයට ප්‍රවේශය හා එහි ගුණාත්මක භාවය වර්ධනය කරනු සඳහා ඊට අනුකූල ප්‍රතිපත්තිමය නිර්දේශ හදවතින් ම පිළිගෙන ඇත.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කොට ඒවා සඳහා ජනාධිපතිතුමාට නිර්දේශ කිරීමේ හා උපදෙස් දීමේ බලය 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ වගන්ති 8(1) යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට පැවරී ඇත. මෙම පනතේ වගන්ති 2(2) ට අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අධ්‍යාපනයේ පරමාර්ථ හා නිෂ්ඨාවන්, පෙර පාසල්, ප්‍රාථමික, ද්විතියික, තෘතියික, උසස් නො විධිමත්, අවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තීය හා ආගමික යන අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය, ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම හා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ක්‍රම හා නිර්ණායක ඇතුළු ව අධ්‍යාපන ආයතනවල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය, ඉගැන්වීමේ මාධ්‍ය, විෂය මාලා විවිධාංගිකරණය, පෙළ පොත් සහ ඉගෙනුම් උපකරණ, ආගමික දැනුම, පිළිපැදීම හා පරිචය ලබන ස්ථානය, තක්සේරු කිරීම හා ඇගයීම, විභාග ක්‍රමය, සහතික, අභිඥාණ පත්‍ර සහ ශාස්ත්‍රීය ප්‍රදාන හා සුදුසුකම් පිළිගැනීම, ගුරුවරුන්, උපකාරක අධ්‍යාපන කාර්ය මණ්ඩලය, අධීක්ෂකයින් සහ පරිපාලකයින් ඇතුළු ව, අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාපනය කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ වෘත්තීය වර්ධනය, ප්‍රජා සහභාගිත්වය උපයෝගි කර ගැනීම ද ඇතුළු ව, අධ්‍යාපනය සඳහා වූ සම්පත් සහ දිවා ආහාරය, සෞඛ්‍ය හා දන්ත සේවා, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ඇතුළු ව ඉගෙනීම සඳහා වූ උපකාරක සේවා ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට (1987) අනුව පෙර පාසල් අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීමේ වගකීම පළාත් සභාවලට පැවරී ඇත. මෙම බලය ක්‍රියාත්මක කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධනය/පෙර පාසල් සඳහා පළාත් ප්‍රඥප්ති මගින් මෙහෙයවනු ලබන පළාත් අධිකාරි/කාර්යාංශ/ඒකක (පළාත් නියාමන අධිකාරි) පිහිටුවා ඇත.

## 1.2 ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ කාලීන ගැටලු

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වාණිජ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන හෝ ලාභ අපේක්ෂා නො කරන සංවිධාන මගින් පාලනය වන ආයතන වේ. රජය ප්‍රමිති නියම කර මෙම අංශය ක්‍රමවත් කරයි. වසරක් හෝ ඊට වැඩි කාලයක් පෙර පාසල් අධ්‍යාපනය ලබා ගැනීම ශ්‍රී ලංකාවේ ළමයින්ට අනිවාර්ය නො වේ. එමෙන් ම පෙර පාසල් අධ්‍යාපනය විධිමත් අධ්‍යාපන ප්‍රතිපත්තිවල සහ පරිපාලන පද්ධතියෙහි අංගයක් ද නො වේ.

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වර්ග කිහිපයක් ක්‍රියාත්මක වේ. පෙර පාසල්, ළදරු උයන්, ළදරු පාසල්, මොන්ටිසෝරි හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආදී වශයෙන් විවිධ නම් භාවිත කරන මෙම පාසල් වර්ග අතර පවතින වෙනස්කම් ළමයින් ඉගෙන ගන්නා පරිසරයේ සිට ඔවුන් ඉගෙන ගන්නා භාෂා හා ඉගෙනීමට මග පෙන්වන දර්ශනයන් දක්වා වූ පරාසයක විහිදී ඇත.

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික සංගණනයට (2017) අනුව[5]:

- ශ්‍රී ලංකාවේ පෙර පාසල් 19,668ක් ඇත. මෙම පෙර පාසල් අතරින් 71%ක ප්‍රතිශතයක් පාලනය වන්නේ පෞද්ගලික සංවිධාන හෝ පුද්ගලයන් මගිනි. 19.8% රාජ්‍ය ආයතන හෝ මහ නගර සභා හා නගර සභා වැනි පළාත් පාලන ආයතන මගින් ද 6.8% ක් ආගමික සංවිධාන මගින් ද 3% ක් රාජ්‍ය නො වන සංවිධාන මගින් ද පාලනය වේ. මෙම පෙර පාසල් අතරින් 88.2% ක් ගාස්තු අය කරයි.

- වයස අවුරුදු 2 සිට 5 දක්වා වූ ළමයි 578,160 මෙම පෙර පාසල්වල ලියා පදිංචි වී සිටිති.

- මෙම ළමයින් අතරින් වයස අවුරුදු 3-5 අතර ළමයින්ගේ ලියා පදිංචි අනුපාතය 55.6% ක් වේ. මෙම වයස් කාණ්ඩයේ ළමයින් අතරින් 50.3% ක් පිරිමි ළමයි වන අතර 49.7% ක් ගැහැනු ළමයි වෙති.

- එක් එක් අංශ අතර කැපී පෙනෙන අසමානතා ඇති බව එම අංශවල ලියා පදිංචි අනුපාත (නාගරික අංශය - 67.6%, ග්‍රාමීය අංශය - 47.5% හා වතු අංශය - 43.9%) පැහැදිලි කරයි.

- පෙර පාසල්වල සේවය කරන ගුරුවර ගුරුවරියන් 28,449 අතරින් 59.9% ක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සමත් ව සිටිති.

- පෙර පාසල් ගුරුවර ගුරුවරියන් අතරින් 83%ක් එක් වසරක හෝ ඊට වැඩි කාලයක වෘත්තීය පුහුණුවක් ලබා තිබුණ ද 9.5% ක් සඳහා එබඳු සුදුසුකම් නො තිබිණි.

පෞද්ගලික හා රාජ්‍ය අංශය මගින් පෙර පාසල්වල සිසුන්ට ලබා දෙන අවස්ථාවල සමස්ත සංඛ්‍යාත්මක වර්ධනයක් තිබෙන නමුදු ප්‍රතිපාදන සැපයීම, පාලනය, නියාමනය හා සහාය වීම සඳහා සීමිත රාජ්‍ය ආයෝජන ඇති පරිසරයක බහුතරයක් පෙර පාසල් ලාභ ලැබීම අරමුණු කර ගත් පෞද්ගලික සේවා සපයන්නන් විසින් පාලනය වීම හේතුවෙන්, ප්‍රතිපත්ති හා වැඩසටහන් මෙන් ම නිසි ලෙස සම්බන්ධීකරණය

---

5 *Sri Lanka, Ministry of Women and Child Affairs, National Census of Early Childhood Development Centres in Sri Lanka 2016 (Colombo, 2018).*

වූ තීරණ ද ගළපා ගැනීමට නො හැකි අන්දමින් මෙම පද්ධතිය දුර්වල ලෙස සංවිධානය වී ඇත.[6] ළමයින්ගේ ඉගෙනීම හා සංවර්ධනය සඳහා අර්ථාන්විත, පුළුල් හා කල් පවත්නා වර්ධනයක් ඇති කිරීමට පෙර පාසල්වලට තිබෙන හැකියාව කෙරෙහි මෙම තත්ත්වය හානිකර ලෙස බල පා තිබේ.

ශ්‍රී ලංකාවේ පෙර පාසල් අංශය තුළ ප්‍රවේශය, ගුණාත්මකභාවය හා පාලනය සම්බන්ධයෙන් මූලික අභියෝග කිහිපයක් අඛණ්ඩ ව පවතී. ඒ අතරින් ප්‍රධානතම අභියෝගය වන්නේ වයස අවුරුදු පහට අඩු බොහෝ ළමයින් පෙර පාසල් නො යාම ය. වර්ෂ 2017 දී පෙර පාසල් අධ්‍යාපනයට සහභාගි වූයේ වයස අවුරුදු 3-5 වයසේ ළමයින්ගෙන් 55.6% ක් පමණි. වයස අනුව වර්ග කර ගත් කළ තුන් හැවිරිදි ළමයින්ගෙන් 22.6% ක් හා සිව් හැවිරිදි ළමයින්ගෙන් (පාසලට ඇතුළු වීමට වසරකට පෙර වයස) 63.4% ක් පෙර පාසල් අධ්‍යාපනයට සහභාගි වී ඇත. පසු ගිය වසර දහය තුළ පෙර පාසලට පැමිණීමේ සංඛ්‍යාවේ වර්ධනය ඉතා සුළු ය. එමෙන් ම දිස්ත්‍රික්ක අතර එම වර්ධනයේ විශාල වෙනස්කම් පවතී. ඇතැම් දිස්ත්‍රික්කවල පැමිණීමේ අනුපාතය පහළ මට්ටමක පැවතීමට හේතු වන කරුණු අතරට නිවසට ආසන්නයේ පෙර පාසල් නො තිබීම, ලියා පදිංචි කිරීමේ ගාස්තු හා ඉගැන්වීමේ ගාස්තු ඉහළ මට්ටමක පැවතීම, පෙර පාසල් අධ්‍යාපනයේ ප්‍රතිලාභ දෙමව්පියන් නො දැන සිටීම හා ඒ හේතුවෙන් එබඳු සේවාවන් ඉල්ලුම් නො කිරීම ද ඇතුළත් වේ. එමෙන් ම, විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා සේවා සැපයෙන පෙර පාසල් ඇත්තේ ද සුළු ප්‍රමාණයකි.

ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ද මූලික අභියෝගයකි. ළමයින්ට ඉගෙනීමට හා සංවර්ධනයට සහාය වීම සඳහා එය කෙතරම් දුරට ඵලදායී වේ ද යන්න තීරණය වන්නේ පෙර පාසල් වැඩ සටහනේ ගුණාත්මකභාවය හා එහි පසුබිම මත ය. මග පෙන්වීම් හා ප්‍රමිති හඳුන්වා දීමෙන් ක්ෂේත්‍රයේ කිසියම් ප්‍රගතියක් සිදු වී ඇති නමුදු, එහි ගුණාත්මකභාවය වර්ධනය වී ඇති ප්‍රමාණයේ විෂමතා පවතී. එසේත් නැත්නම් පොදුවේ එහි තත්ත්වය පහළ මට්ටමක පවතී. ඉහළ ගුණාත්මකභාවයක් සඳහා අත්‍යවශ්‍ය අවම මූලිකාංගවල පරාසය ගෙන බලන කළ එහි පහළ අන්තයේ පෙර පාසල්වලට සුදුසු යටිතල පහසුකම් පවා නොමැති අතර එහි අනෙක් අන්තයේ පෙර පාසල්වලින් ළමයින්ගේ කායික ශුභ සිද්ධිය සහතික කෙරෙන නමුදු ළමයින්ගේ වයසට හෝ පෞද්ගලිකත්වයට හෝ ගැළපෙන අන්දමේ ඉගෙනීමේ වැඩසටහන් ක්‍රියාත්මක නො වීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවට ගුණාත්මකභාවයේ අත්‍යවශ්‍ය ආරම්භක ස්ථානය ලෙස සැලකිය හැකි වයස අවුරුදු 3-5 අතර ළමයින් සඳහා වූ මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති තිබේ. එසේ වුව ද, ළමයින්ගේ අධ්‍යාපනයට දායක වන ගුරුවරුන්ගේ, දෙමව්පියන්ගේ හා සියලුම වැඩිහිටියන්ගේ කැමැත්ත මත එය අධ්‍යාපනය සඳහා සම්පතක් ලෙස පිළි ගැනීම හා භාවිත කිරීම රඳා පවතී. එමෙන් ම, සියලු ම පෙර පාසල් අධ්‍යාපන සේවා සපයන්නන් විසින් ක්‍රියාත්මක කළ යුතු සෑම අත්‍යවශ්‍ය අංශයක් ම ඇතුළත් ජාතික විෂයමාලා රාමුවක් ද නොමැත. පෙර පාසල් සඳහා ශ්‍රී ලංකාව මග පෙන්වීම් හඳුන්වා දී ඇත. එහෙත්, ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලද තත්ත්ව පාලන යාන්ත්‍රණයක් නොමැති වීමෙන් පෙනී යන්නේ එම මග පෙන්වීම් භාර ගෙන ක්‍රියාත්මක කිරීම ඔවුන්ගේ කැමැත්ත මත රඳා පවතින බව ය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ජාතික පද්ධතිය තුළ පන්ති කාමර ව්‍යුහය, ව්‍යවහාර හා සිසුන්ගේ ඉගෙනුම පිළිබඳ අවම ප්‍රමිති අසාර්ථක වීම ය. එමෙන් ම පෙර පාසල් අධ්‍යාපනය තුළ විධිමත් ක්‍රමවේද හා තාක්ෂණ සහාය ලබා දීමට මෙන් ම සංවර්ධනය සහ නියාමනය, ඇගයුම හා වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය විශේෂඥයින්ගේ ද හිඟයක් පවතී.

6 *United Nations Children's Fund, "Required Investments to Deliver High Quality Early Childhood Education (ECE) in Sri Lanka", discussion paper presented at the 'Building Brains, Building Futures' - Sri Lanka Early Childhood Development High-Level Meeting, July 2018.*

1

හැඳින්වීම

ගුණාත්මකභාවයකින් යුතු පෙර පාසල් අධ්‍යාපනයක් ලබා දීම සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ හා ළමයින් රැක බලා ගන්නා සහායක ශ්‍රමිකයන්ගේ සූදානම ද බොහෝ විට දුර්වල මට්ටමක පැවතීම තවත් ගැටලුවකි. පෙර පාසල් ගුරුවරයකු/ගුරුවරියක ලෙස ක්ෂේත්‍රයට ඇතුළු වීමට අවශ්‍ය සුදුසුකම් වර්තමානයේ දැඩි ව සලකා නො බැලෙන අතර, ඒ සඳහා ඔවුන්ට තෘතීයික අධ්‍යාපනික සුදුසුකම් අවශ්‍ය නො වේ. ඔවුන් ලබන වේතනය ද ප්‍රාථමික පාසල් ගුරුවරුන් ලබන වේතනය හා සැසඳිය නොහැකි අතර ඔවුන් සඳහා ස්ථාපිත වැටුප් පරිමාවක් ද නොමැත. රැකියාවේ ඉහළට යාමේ මාර්ගය පිළිබඳ රාමුවක් පෙර පාසල් ගුරුවරුන්ට නොමැති අතර වෘත්තීය සහතික ලබා දීමේ හෝ කලින් කල ප්‍රතීතන කිරීමේ හෝ ක්‍රමවේදයක් නොමැත. පෙර පාසල් ගුරුවරුන් සඳහා රජය හා වෙනත් සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් බහුල ව පිරිනමනු ලබන පුහුණුව සැමවිට ම කුසලතාවලට මාරු නො වන අතර ඒවා තක්සේරු කරන ලද පුහුණු අවශ්‍යතා මත පදනම් ව නොමැත. ළමයින් ඔවුන්ගේ ගුරුවරුන් සමග සිදු කරන අන්තර් ක්‍රියා මුල් ළමාවිය අධ්‍යාපනයේ ගුණාත්මක බව තීරණය කරන එක ම හා අතිශයින් ම වැදගත් සාධකය වේ. එබැවින් පෙර පාසල් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය හා සමාජය තුළ ඔවුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීම, ශක්තිමත් පෙර පාසල් අධ්‍යාපන පද්ධතියක මුලින් ම තිබිය යුතු අවශ්‍යතාවකි.

දෙමව්පියන්ගේ කාලය තම ළමයින්ගේ පෙර පාසල් අධ්‍යාපනය සඳහා යෙදවීම සීමිත වීමෙන් අනාවරණය වන්නේ ඉගෙනුම් ප්‍රතිඵල ඉටුකර ගැනීම දෙමව්පියන්ගේ මෙන් ම, ගුරුවරුන්ගේ ද ඒකාබද්ධ වගකීමක් බව අවබෝධ කර නො ගැනීම යි. පෙර පාසල් යනු ප්‍රාථමික පාසලට ඇතුළත් වීම සඳහා ළමයින් ශාස්ත්‍රීය වශයෙන් සූදානම් කරන මධ්‍යස්ථාන ලෙස දකින දෙමව්පියෝ, පෙර පාසල් අධ්‍යාපනයේ නෛසර්ගික ප්‍රතිලාභවලට සාපේක්ෂ වශයෙන් අඩු වටිනාකමක් ලබා දෙති.[7] දෙමව්පියන් සඳහා සියලුම ආකාරයේ සහාය හා උපදේශාත්මක සේවා නො තිබෙන අතර, ගුරුවරුන්ට ද ඔවුන් පෙර පාසලේ කටයුතු සඳහා අර්ථාන්විත ලෙස සහභාගි කරවා ගැනීමට අවශ්‍ය හැකියාව හෝ සම්පත් නොමැත.

තවද, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අංශය පිළිබඳ දත්ත හා පර්යේෂණ තොරතුරු විරල හෝ ලබා ගැනීමට අපහසු හෝ වන අතර ඒවා පාර්ශ්වකරුවන් හා පද්ධති බොහොමයක් අතර විසිරී පවතින බැවින්, ප්‍රතිපත්ති සම්පාදනය, කාර්යක්ෂම ව සම්පත් වෙන් කිරීම සහ ඵලදායී ලෙස සේවා සැපයීම සඳහා දත්ත භාවිත කිරීම දුෂ්කර වී ඇත.

ශ්‍රී ලංකාවේ ළමයින්ට සේවා සපයන රාජ්‍ය ආයතන අතර සැලකිය යුතු තිරස් සහ සිරස් සම්බන්ධීකරණ අභියෝගයන් පවතින අතර නායකත්ව ශක්‍යතාවන්ගේ ද හිදැස් පවතී. ආයතන අතර සම්බන්ධීකරණය හා ආයතනවල ශක්‍යතාවන් වඩාත් ශක්තිමත් කිරීමට ප්‍රයත්නයන් ගෙන ඇති නමුදු, භාවිතය අපේක්ෂණවලට වඩා බෙහෙවින් අඩු ය. එමෙන් ම, පෙර පාසල් පද්ධතියේ පරිපාලනය විමධ්‍යගත වීම හා භූමිකා පැහැදිලි නොවීම යන කරුණු ඊට අදාළ ගුණාත්මක රාමුවලට, ප්‍රමිතිවලට සහ ඒ ඒ පළාත්වල ප්‍රගතියට මෙන් ම ඉදිරි පෙළ සේවකයන්ගේ අතිච්ඡාදනය වන භූමිකාවන්ට හා වගකීම්වලට තාවකාලික පිළියම් යෙදීම සඳහා මග පාදා ඇත. පෙර පාසල් වැඩි දියුණු කිරීමට හා ව්‍යාප්ත කිරීමට ප්‍රමාණවත් ස්ථිරසාර රාජ්‍ය ආයෝජන අවශ්‍ය ය. අධ්‍යාපනය සඳහා කෙරෙන ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය ආයෝජනවල වර්ධනය අපේක්ෂා දල්වන නමුදු, පෙර පාසල් සඳහා කරනු ලබන රාජ්‍ය වියදම් අනෙකුත්

7 *Saurav Dev Bhatta, Roshini Mary Ebenezer, and Quynh T. Nguyen, Laying the Foundation for early childhood education in Sri Lanka: investing early, investing smartly, and investing for all (Washington, D.C., World Bank Group, 2014).*

මධ්‍යම හා ඉහළ ආදායම් ලබන රටවල රාජ්‍ය වියදම්වලට වඩා ඉතා පහළ මට්ටමක පවතී.[8] පෞද්ගලික අරමුදල් සැපයුම මත රඳා පැවැත්ම අසාධාරණත්වයේ හා අස්ථාවරත්වයේ පැවත්මට දොරටු විවර කරයි.

මෙම මූලික අභියෝග, ශ්‍රී ලංකාව පුරා ගුණාත්මක ලෙස පෙර පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව සැපයීම දුර්වල කර ඇති අතර, පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් මඟින් ක්‍රමවත් ප්‍රවේශයක් සකස් කර ගැනීම කඩිනමින් කළ යුතු කාර්යයක්ය.



8 *Halil Dundar, Benoît Millot, Michelle Riboud, Mari Shojo, Harsha Aturupane, Sangeeta Goyal, and Dhushyanth Raju, Sri Lanka education sector assessment: achievements, challenges, and policy options (Washington, D.C., World Bank Group, 2017).*

# 2. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

## 2.1 ජාතික ප්‍රතිපත්තියෙහි අභිමතාර්ථ හා මෙහෙයවීමේ මූලධර්ම

### අභිමතාර්ථ

යෝජිත ජාතික ප්‍රතිපත්තිය, ළමයකුගේ සංවර්ධනයට මෙන් ම සෑම ළමයකුගේ ම අයිතියක් වශයෙන් සහ මහජන යහපත පිණිස වන සේවාවක් හා රාජ්‍ය වගකීමක් වශයෙන් රජය විසින් පෙර පාසල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිගෙන ඇති බව පෙන්නුම් කරයි. 'කිසිවකු අත් නො හැරීමේ' දැක්ම සහිත ව 'සියලුම ළමයි දක්ෂ ශිෂ්‍යයෝ වෙති' සහ 'සාකල්‍ය සංදර්භයක් තුළ වර්ධනය වෙමින් ඉගෙන ගන්නා වූ අයිතිවාසිකම් දරන්නෝ වෙති' යන්න පිළිගනිමින් ප්‍රගාමී, විශ්වව්‍යාපී ප්‍රවේශයන් අදාළ කර ගෙන ශ්‍රී ලංකාව තුළ ගුණාත්මකභාවයෙන් යුතු පෙර පාසල් අධ්‍යාපනයක් සැපයීමට අවශ්‍ය පද්ධති දියුණු කිරීම සඳහා ප්‍රායෝගික, අන්‍යෝන්‍ය වශයෙන් සවිගන්වන ක්‍රමෝපාය සහිත සැලැස්මක් හඳුන්වා දීමට මෙම ප්‍රතිපත්තිය බැඳී සිටී.

අදාළ ගුණාත්මක ප්‍රමිතිවලට අනුව ක්‍රියා කිරීම සහතික කරනු පිණිස මෙරට පෙර පාසල් අංශය සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සියලු ම ළමයින්ට පෙර පාසල් අධ්‍යාපනයට ප්‍රවිෂ්ට වීමට හැකි වන පරිදි ප්‍රගාමී අයුරින් එය ක්‍රියාත්මක කළ යුතුය. රජය විසින් ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සඳහා පෞද්ගලික සේවා සපයන්නන්ගේ සහභාගිත්වය දිරිගන්වන අතර ඊට සහභාගි වන ලෙස ඔවුන්ට ආරාධනා කරනු ලැබේ.

යෝජිත ජාතික ප්‍රතිපත්තිය වයස අවුරුදු තුන සහ පහ අතර ළමුන් ඉලක්ක කර ගත් මධ්‍යස්ථාන මත පදනම් වූ සියලු වැඩසටහන් සඳහා අදාළ වේ.

මෙම පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීම මගින්, උසස් තත්ත්වයේ පෙර පාසල් වැඩසටහන් සඳහා ඇතුළු වී ගුණාත්මක බවේ ප්‍රතිලාභ ලබා ගැනීමේ ශක්‍යතාව ළමයින් රැසකට ලබා දීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදී, ස්ථිරසාර සමාජයක සක්‍රිය පුරවැසියන් වීමට අවශ්‍ය නිපුණතා ඔවුන්ට ලැබෙනු ඇත. රාජ්‍ය ආදායම ඉතිරි වනු ඇත. එමගින් ශ්‍රී ලංකාව තුළ උගත් හා වෘත්තීය පෙර පාසල් සේවක පිරිසක් බිහි වනු ඇත. වඩාත් වැදගත් වන්නේ, සියලු තිරසර සංවර්ධන ඉලක්ක සාධනය කර ගැනීම සඳහා අධ්‍යාපනය කේන්ද්‍රගත කර ගැනීම නැවත තහවුරු කරමින් එහි 4.2 අරමුණ වූ *වඩාත් හොඳින් පාලනය වන පෙර පාසල් පද්ධතියක් හරහා 2030 වන විට සියලු ගැහැනු ළමයින් සහ පිරිමි ළමයින් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම් කෙරෙන, ඔවුන් සියලු දෙනා හට ගුණාත්මකභාවයෙන් යුතු මුල් ළමාවිය සංවර්ධනය, රැකවරණය හා පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය වෙත ප්‍රවේශය තහවුරු කිරීම* යන වගකීම ඉටු කිරීමට ශ්‍රී ලංකාවට හැකි වීම ය.

## මෙහෙයවීමේ මූලධර්ම

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි ඉලක්ක සපුරාලීම සඳහා පහත දැක්වෙන ළමා සංවර්ධනය පිළිබඳ ගෝලීය මූලධර්ම මග පෙන්වනු ලබයි.

- ජීවිතයට, පැවැත්මට හා සංවර්ධනයට සියලුම ළමයින්ට සහජ අයිතියක් ඇත. මුල් ළමා වියෙහි දී අධ්‍යාපනය සඳහා ඇති අයිතිය උපතේ දී ආරම්භ වන අතර එය ඔවුන්ගේ පූර්ණ විභවතා සංවර්ධනය කර ගැනීමට ඇති අයිතිය සමග නෛසර්ගික ව බැඳී පවතී.

- සෑම ළමයකු ම සමාන ලෙස අගය කොට සැලකිය යුතු අතර, සෑම ළමයකුට ම සමාන ලෙස සභාය විය යුතු ය. ඔවුන්ට ආරක්ෂිත හා රැකවරණය සහිත පරිසරයක් සැපයීම සහතික කිරීම සඳහා තථ්‍ය හෝ සංජානනික වාර්ගිකත්වය, භාෂාව, වර්ණය, පෙළපත, මුල් ජාතිය, ආගම, ආගමික භාවිතය, දෙමව්පියන්ගේ තත්ත්වය, ශාරීරික හෝ මානසික ආබාධ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ සමාජ ආර්ථික තත්ත්වයන් මත පදනම් වූ කිසිදු ආකාරයක වෙනස් කොට සැලකීමකින්, පෙර පාසල් පරිස්ථිතිය තොර විය යුත්තේ ය.

- ළමයින් හට සමාන ව සලකනු ලැබුව ද පෙර පාසල් අධ්‍යාපනයේ දී තම හැකියාවන් වර්ධනය කර ගත හැකි වන පරිදි වැඩි අවශ්‍යතාවක් හා වැඩි අවදානමක් සහිත ළමයින් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. එසේ කිරීමෙන්, පැතිරී පවතින දරිද්‍රතාවයේ සහ අවදානමට ලක් වීමේ චක්‍රය බිඳ හෙළීමට උපකාරී විය හැකි ය.

- ළමා සංවර්ධනය සාකල්‍ය වන අතර එකිනෙක මත රඳා පවතින මානයන්ගෙන් සමන්විත වේ. එබැවින් ළමයකුගේ බහුවිධ අවශ්‍යතාවලට අදාළ, සාකල්‍ය සමෝධානික ප්‍රවේශයක් පෙර පාසල් අධ්‍යාපනය සඳහා යොදා ගත යුතු ය.

- ඉගෙනීම අඛණ්ඩ ව හා සමුච්චිත ව සිදු වන අතර ළමයි ක්‍රීඩාව මගින් ඉගෙන ගනිති. එබැවින් පෙර පාසල් අත්දැකීම් විනෝදාත්මක විය යුතු අතර ඒවා ළමයින්ගේ තේරීම හා ඔවුන් ඉගෙන ගන්නා ස්වාභාවික විධි ගරු කරන, ක්‍රීඩාව පදනම් වූ ළමා කේන්ද්‍රීය ක්‍රියාකාරකම් තුළින් පිරිනැමිය යුතු ය.

- ළමයි තම දැනුම තමා විසින් ම ගොඩනගා ගනිති. ඔවුන්ට ලබා දෙන පරිසරයේ ගුණාත්මකභාවය, සැලසුම් කිරීමට, සහභාගි වීමට හා තම ඉගෙනුම තමා විසින් ම ඇගයීමකට ලක් කිරීමට, ඔවුන්ගේ සම්බන්ධ වීම මත ඉගෙනීම රඳා පවතී.

- සියලුම ළමයින් හැකියාවන්ගෙන් හා නිපුණත්වයකින් යුත් සිසුන් වන නමුත් සෑම ළමයෙක් ම තමාට ආවේණික වේගයකින් සංවර්ධනය වෙයි. එබැවින් පෙර පාසල් ළමයින් සඳහා සපයනු ලබන ඉගෙනුම් අත්දැකීම් සංවර්ධනයට (වයස මෙන් ම පුද්ගලයා අනුව) උචිත විය යුතු ය.

- සම වයසේ ළමයින්, පවුල, ප්‍රජාව, සංස්කෘතිය, අවස්ථා සහ තත්ත්වයන් තම ඉගෙනීම හා සංවර්ධනය කෙරෙහි බලපෑම් එල්ල කරන පරිසරයක් තුළ ළමයි ජීවත් වෙති. එබැවින් මුල් ළමා විය ශ්‍රම බලකාය, ළමයින් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී හා ලබා දීමේ දී ළමයින් වෙසෙන සන්දර්භය කෙරෙහි සංවේදී විය යුතු ය.

- ළමා සංවර්ධනය හා ඉගෙනීම, දෙමව්පියන්ගේ හා ගුරුවර ගුරුවරියන්ගේ ඒකාබද්ධ වගකීමක් වේ. ළමයින්ට ඉගෙනීමට, වර්ධනය වීමට සහ පෙර පාසල් පරිසරය තුළ මෙන් ම ඔවුන්ගේ නිවසේ පරිසරය තුළ ද අගය කරන්නේ යැයි යන හැඟීම ඇති වීමට සහාය වීමේ දී දෙමව්පියන්ගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය ය.

- දරුවෝ තමන්ගේ මව් භාෂාවෙන් හෝ නිවසෙහි බහුල ව භාවිතා කරන භාෂාවෙන් වඩාත් හොඳින් ඉගෙන ගනිති. නිවසින් පෙර පාසලට සුමට ලෙස සංක්‍රාන්ත වීමට හැකි වන පරිදි පෙර පාසල් පරිසර තුළ එක් එක් ළමයාගේ මව් භාෂාව හෝ නිවසෙහි බහුල ව භාවිත කරන භාෂාව හෝ සක්‍රීය ලෙස යොදා ගැනීම හා භාවිත කිරීම සිදු කළ යුතු ය.

## 2.2 දැක්ම හා මෙහෙවර



### දැක්ම

තම පූර්ණ විභවතා ළඟා කර ගැනීම සහතික කිරීමට කැප වුණු පරිසරයක වැඩෙමින් පෙර පාසල් වයසේ පසු වන සෑම ළමයෙක් ම සාර්ථක ව ඉගෙන ගනියි.

### මෙහෙවර

අවදානම් සහිත හා අවාසිදායක තත්ත්වයේ පසු වන ළමයින් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම ළමයින්ට ඵලදායි, ප්‍රතිචාරාත්මක, වගකීමෙන් යුතු, සම්පත් කාර්යක්ෂම ලෙස භාවිත කෙරෙන පෙර පාසල් පද්ධතියක් තුළින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතු, සාධාරණ වූ, පහසුවෙන් ප්‍රවේශ විය හැකි වූ සහ වියදම් දැරිය හැකි වූ පෙර පාසල් අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම හා සුසාධ්‍ය කිරීම.

## 2.3 සුවිශේෂී අරමුණු

ජාතික ප්‍රතිපත්තිය පහත සඳහන් සුවිශේෂී අරමුණු වලින් සමන්විත යː

1. පෙර පාසල් වයසේ සියලු ම ළමයින්ට ඔවුන්ගේ පූර්ණ විභවතාවන් ළඟා කර ගැනීමට සහාය වනු පිණිස ඔවුන්ට සාධාරණ හා අන්තර්කරණ ඉගෙනුම් අවස්ථා ලබා දීම.

2. ළමයින්ගේ ප්‍රශස්ත සංවර්ධනය ප්‍රවර්ධනය කරන උසස් තත්ත්වයේ පෙර පාසල් වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.

3. පෙර පාසල් සේවක පිරිසේ සුදුසුකම්, පුහුණු වීම් හා සේවා තත්ත්වයන් ඉහළ නැංවීම.

4. ප්‍රථම මෙන් ම වඩාත් ස්ථාවර වූ අධ්‍යාපනයක් ළමයින්ට ලබා දෙන්නන් ලෙස දෙමව්පියන්, පවුල හා ප්‍රජාව ළමයාගේ අධ්‍යාපනයට සහභාගි කරවා ගැනීම.

5. සාක්ෂි මත පදනම් වූ තීරණ හා භාවිතයන්ට සහාය වනු පිණිස දත්ත සහ පර්යේෂණ සංවර්ධනය කිරීමට හා භාවිත කිරීමට දිරි ගැන්වීම.

6. පෙර පාසල්වලට අදාළ පාලනය වැඩි දියුණු කිරීම හා පෙර පාසල් අධ්‍යාපනය සඳහා සම්පත් වෙන් කිරීම ඉහළ නැංවීම.

# 3. ක්‍රියාමාර්ග ගනු ලබන ක්ෂේත්‍ර

ජාතික ප්‍රතිපත්තියෙහි සුවිශේෂී අරමුණු හය පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිශ්චය කරන ලද ක්ෂේත්‍ර හයක් ඔස්සේ ක්‍රියාත්මක වේ. ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන මෙම එක් එක් ක්ෂේත්‍රයට ප්‍රතිපත්තියෙහි අරමුණු ළඟා කර ගැනීමට දායක වන උපායමාර්ග සහිත ප්‍රතිපත්ති ප්‍රකාශයක් මගින් මග පෙන්වීම කරනු ලැබේ.

1. පෙර පාසල් අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශය
2. පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය
3. පෙර පාසල් අධ්‍යාපනයට අදාළ ශ්‍රම බලකායෙහි සංවර්ධනය
4. දෙමව්පියන්, පවුල හා ප්‍රජාවගේ සහභාගිත්වය
5. දත්ත, පර්යේෂණ, ඇගයුම හා ලේඛන ගත කිරීම
6. පෙර පාසල් අධ්‍යාපනය පාලනය හා මූල්‍ය සම්පත් භාවිතය

## 3.1 පෙර පාසල් අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශය

### ප්‍රතිපත්ති 1:

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වයසේ පසු වන සියලුම ළමයින්ට, පෙර පාසල් අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කළ යුතු වේ.

1

ප්‍රතිපත්ති

### උපායමාර්ග

3.1.1 තිරසාර යටිතළ පහසුකම් හා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ණය සහන සඳහා ප්‍රවේශයන්, පුහුණුව හා උපදේශාත්මක සේවාවන් වර්ධනය කිරීම තුළින් පෙර පාසල් සඳහා පහසුකම් සැලසීම.

3.1.2 පෙර පාසලට ඇතුළත් වීමේ සංඛ්‍යාව අඩු ප්‍රදේශ ප්‍රමුඛත්වයේ ලා සලකමින්, පෙර පාසල්වලට භෞතික සම්පත් සපයනු සඳහා ජාතික හා පළාත් නියාමන අධිකාරීන් දිරි ගැන්වීම.

3.1.3 විශේෂයෙන් දරිද්‍රතාව, ආබාධිත තත්ත්ව, ප්‍රචණ්ඩත්වය, ආපදා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ පක්ෂපාතිත්වයන්, ආයතනගත රැකවරණය හා නො පැමිණීම සහ සිරගෙවල රැඳවියන් වශයෙන් සිටින මවුවරුන් සමඟ වෙසෙන ළමයින් වීම යනාදී කරුණු හේතුවෙන් අවදානමට ලක් විය හැකි ළමයින්ට සේවා සැපයීම සඳහා පළාත් නියාමන බලධාරීන් මගින් කළමනාකරණය කෙරෙන පෙර පාසල් ජාලයක් ශක්තිමත් කිරීම.

1

ප්‍රතිපත්ති

3.1.4 සමාජ ආරක්ෂක යෝජනා ක්‍රම වෙතින් සහාය ලැබෙන හෝ ලැබීමට සුදුසුකම් ලබන පවුල්වල ළමයින් සුදුසුකම් සහිත ලාභ අපේක්ෂා නො කරන පෙර පාසල්වලට ඇතුළත් කර ගැනීම සඳහා යෝග්‍ය සහනාධාර 'එක් එක් ළමයා' යන පදනම මත හඳුන්වා දීමට පහසුකම් සැලසීම.

3.1.5 වඩාත් අවදානමට ලක් විය හැකි හා අවාසිදායක තත්ත්වයේ (විශේෂ අවශ්‍යතා සහිත ළමයින් ද ඇතුළු ව) ළමයින්ට පෙර පාසල් අධ්‍යාපනය තුළින් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි පෙර පාසල් පරිසරය තුළ අන්තර්කරණ භාවිතයන් සඳහා පහසුකම් සැලසීමට සම්පත් හා මග පෙන්වීම් හඳුන්වා දීම.

3.1.6 පෙර පාසල් පන්ති කාමරය තුළ විවිධත්වය, නියෝජනය හා එක්සත් සමාජ වර්ධනය කිරීම සඳහා භාවිතයන් දිරි ගැන්වීම.

3.1.7 හදිසි අවස්ථාවල දී හා ඉන් පසුව පෙර පාසල් සේවාවන් අඛණ්ඩ ව සැපයීම සහතික කිරීම සඳහා ඊට සූදානම් වීමට සහ ප්‍රතිචාර දැක්වීමට ජාතික ප්‍රමිති හා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම.

3.1.8 ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන්, ආයෝජකයන්, ව්‍යවසායකයන් සහ මහජනතාව අතර පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ව මෙන් ම ඒ සඳහා සහාය ලබා දීම කෙරෙහි කැමැත්ත උත්පාදනය කිරීමට දිරි ගැන්වීම.

## 3.2 පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය

2

ප්‍රතිපත්ති

### ප්‍රතිපත්ති 2:

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වයසේ පසු වන සියලුම ළමයින්ට ඔවුන්ගේ සමස්ත සංවර්ධනය හා පාසලට සූදානම වර්ධනය කෙරෙන ඉහළ ගුණාත්මකභාවයකින් යුතු ඉගෙනුම් අවස්ථා සහතික කළ යුතු වේ.

### උපායමාර්ග

3.2.1 ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති, පෙර පාසල් විෂය මාලාව සහ ක්‍රියාවට නංවන භාවිතයන් සඳහා පදනම් කරගනු ලබන මාර්ගෝපදේශය ලෙස භාවිත කරමින් ඵලදායී අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීමට දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම.

3.2.2 පෙර පාසල් අධ්‍යාපනය සඳහා සංවර්ධනයට යෝග්‍ය භාවිතයන්ට අනුකූල ජාතික විෂයමාලා රාමුවක් සකස් කිරීමට දිරි ගැන්වීම හා එය භාවිත කිරීමට සහාය ලබා දීම.

3.2.3 පෙර පාසල් පරිසර තුළ සුදුසු පරිදි වෙනත් භාෂා යොදා ගනිමින් මව්බස පදනම් කර ගත් අධ්‍යාපනයක් භාවිත කිරීමට දිරි ගැන්වීම.

3.2.4 ඉගෙනීම සඳහා උසස් තත්ත්වයේ භාවිත සහ පරිසර සඳහා අවශ්‍ය තත්ත්වයන් නිර්මාණය කිරීමට පෙර පාසල් සඳහා නියාමනය කරන ලද ජාතික ප්‍රමිති සකස් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට, සහ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

3.2.5 පළාත් නියාමන බලධාරීන් මගින් පෙර පාසල් අධ්‍යාපනයේ සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති මත පදනම් වූ පොදු දර්ශක රාමුවක් සකස් කිරීම.

3.2.6 පෙර පාසල් අධ්‍යාපන සේවා සපයන්නන් සඳහා ජාතික වශයෙන් තරා කිරීමේ පද්ධතියක් සකස් කිරීම ප්‍රවර්ධනය කිරීම. නියාමනය කරන ලද ජාතික හා පළාත් තත්ත්ව ප්‍රමිතීන්ට අනුව සේවාවන් තක්සේරු කෙරෙනු ඇත.

3.2.7 ළමයින්ගේ ඉගෙනීම, සංවර්ධනය සහ පාසලට ප්‍රවේශය සඳහා සූදානම, තක්සේරු කිරීම සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති මත පදනම් වූ වලංගු තක්සේරු උපකරණ කලින් කලට සහ ක්‍රමානුකූල ව භාවිත කිරීම දිරි ගැන්වීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.

3.2.8 ක්‍රීඩාව පදනම් කර ගනිමින් ඉගෙනීම සඳහා උත්තේජක ලෙස ළමා මිතුරු පොදු ස්ථාන සහ ක්‍රීඩා පිටි සඳහා ආයෝජනය කිරීම දිරි ගැන්වීම හා ඒ සඳහා පහසුකම් සැපයීම.

3.2.9 ප්‍රාථමික පාසලට සුමට ලෙස සංක්‍රාන්ත වීමට සහාය වනු සඳහා පෙර පාසල හා ප්‍රාථමික පාසල අතර සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට දිරිගැන්වීම.

3.2.10 පෙර පාසල් වයසේ ළමයින්ට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් උසස් තත්ත්වයේ අධ්‍යාපනික වැඩසටහන් ලබා දීම.

3.2.11 වාණිජමය හෝ වාණිජමය නො වන චේතනාවෙන් පෙර පාසල් සහ පෙර පාසල් වයසේ ළමයින් සඳහා නිෂ්පාදනය කෙරෙන අධ්‍යාපනික මෙවලම්වල (විද්‍යුත් හෝ මුද්‍රිත) යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

## 3.3 පෙර පාසල් අධ්‍යාපනයට අදාළ ශ්‍රම බලකායෙහි සංවර්ධනය

### ප්‍රතිපත්ති 3:

සියලු ම පෙර පාසල් ගුරුවර, ගුරුවරියන් හා පෙර පාසල් ළමයින්ට මග පෙන්වන වෙනත් පිරිස්, කාර්යක්ෂම හා ඵලදායී වූ ප්‍රතිපත්ති, යහපත් සේවා තත්ත්වයන්, වෘත්තීය ස්වාධීනත්වය හා රැකියාව තුළ ඉහළට යෑම සඳහා වූ මාර්ග වල අනුග්‍රහය ඇති ව අදාළ මූලික හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයට සහභාගි වී ඔවුන්ගේ වෘත්තීය භූමිකාව පූර්ණ ලෙස ඉටු කළ හැකි පරිදි මනා සුදුසුකම්වලින් යුක්ත විය යුතු වේ.

### උපායමාර්ග

3.3.1. ළමයින් සමග කටයුතු කිරීම සඳහා පුද්ගලයකුගේ සුදුසුකම් විධිමත් පිළිගැනීමකට ලක් කරනු පිණිස පෙර පාසල් ගුරුවර ගුරුවරියන් සහතික කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම.

3.3.2. පෙර පාසල් ගුරුවර ගුරුවරියන්ගේ වෘත්තීය තත්ත්වය අගය කිරීමට හා ඉහළ නැංවීමට ඔවුන් සඳහා වැටුප්, දීමනා සහ ප්‍රතිලාභ ප්‍රමිති ස්ථාපිත කිරීම.

3

ප්‍රතිපත්ති

3.3.3. අධ්‍යාපනයේ මට්ටම, අත්දැකීම්, පෙන්නුම් කරන නිපුණතා සහ වැටුප් හා දීමනා ගෙවීම් ඉහළ දැමීම තුළින් පෙර පාසල් ගුරුවර ගුරුවරියන්ට තම වෘත්තියට ප්‍රවිෂ්ට වීමට හා වෘත්තීය අභිවෘද්ධිය ළඟා කර ගැනීමට මාර්ගයක් සපයා දෙන වෘත්තීය මාවත් සංවර්ධනය කිරීම.

3.3.4. පෙර පාසල් අධ්‍යාපනයේ ශ්‍රම බලකාය සඳහා සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි හා පශ්චාත් උපාධි මට්ටමේ වැඩසටහන් සැලසුම් කිරීම හා ලබා දීම පිණිස විශ්ව විද්‍යාල, ගුරු අධ්‍යාපනය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතන සහ ගුරු පුහුණුව සපයන වෙනත් ආයතන දිරි ගැන්වීම.

3.3.5. ප්‍රවේශ මට්ටමේ දී සහ ඉන් ඉහළට මුල් ළමාවිය අධ්‍යාපනය හා ළමා සංවර්ධනය පිළිබඳ ඉගෙනුමක් ලබා ගැනීම සඳහා පෙර පාසල් ශ්‍රම බලකාය වෙත දක්ෂතා මත පදනම් වූ ශිෂ්‍යත්ව හා අවශ්‍යතා මත පදනම් වූ අනුග්‍රහයන් ලබා දීමට විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ ගුරු අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.

3.3.6. මුල් ළමාවිය පිළිබඳ ආදර්ශමත් නායකයින් හා ගුරුවර ගුරුවරියන් මෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් හා තම නව්‍ය භාවිත සම්බන්ධයෙන් විශිෂ්ටත්වය ළඟා කර ගත් ආදර්ශමත් මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන පිළිගැනීම හා ඔවුන් වෙත තිළින ප්‍රදාන කිරීමේ පරිපාටියක් ස්ථාපිත කිරීම.

3.3.7. පෙර පාසල් අධ්‍යාපන ශ්‍රම බලකායට පිරිනමන පූර්ව සේවා වැඩසටහන් ප්‍රතීතනය කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.

3.3.8. පෙර පාසල් අධ්‍යාපන ශ්‍රම බලකායට පුහුණු වීම හා ඉගෙනීම සඳහා පරීක්ෂණාගාර ලෙස පළාත් මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.

3.3.9. පෙර පාසල් ආශ්‍රිත වගකීම් සහිත කාර්යයන් සඳහා කාර්යාලවලට පත් කර ඇති රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රේරණ හා අනුස්ථාපන වැඩසටහනක් හඳුන්වා දීම.

3.3.10. පෙර පාසල් අධ්‍යාපන ශ්‍රම බලකාය සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික පුහුණුව හා භාවිතය තුළින් ඉගෙනීම මත පදනම් වූ වඩා හොඳින් සම්බන්ධීකරණය කරන ලද ඉලක්කගත සේවාස්ථ වැඩසටහන් සඳහා ආයෝජන දිරි ගැන්වීම.

4

## 3.4 දෙමව්පියන්, පවුල හා ප්‍රජාවගේ සහභාගිත්වය

ප්‍රතිපත්ති 4:

පූර්ව-ප්‍රාථමික අධ්‍යාපන වැඩසටහන් මෙන් ම පවුල තුළ ක්‍රියාත්මක වන භාවිතයන් ද ශක්තිමත් කිරීම සඳහා සියලු ම පවුල් සහ ප්‍රජාවන් ළමයාගේ ඉගෙනුමේ සහ සංවර්ධනයේ ක්‍රියාකාරී සහභාගිවන්නන් සහ හවුල්කරුවන් විය යුතු වේ.

ප්‍රතිපත්ති

## උපායමාර්ග

3.4.1. දෙමව්පියන්ගේ, පවුලේ වැඩිහිටි සාමාජිකයන්ගේ (උදාඃ ආච්චි, සීයා, නැන්දා හෝ මාමා) සහ මුල් ළමාවිය සංවර්ධනයට හා පෙර පාසල් අධ්‍යාපනයට අදාළ සේවාවන් සපයන්නන්ගේ ආකල්ප, වටිනාකම් හෝ චර්යා හැඩගැස්වීම සඳහා ජාතික හා පළාත් මට්ටමින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.4.2. පෙර පාසල හා නිවස තුළ ළමයින්ගේ ඉගෙනීම සහ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා ජාතික හා පළාත් මට්ටමින් පවුල සහ ප්‍රජා සහභාගිත්වය සහිත පරිපූර්ණ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම හා ශක්තිමත් කිරීම.

3.4.3. පෙර පාසල් පන්ති කාමරය තුළ අන්තර්කරණය හා විවිධත්වය සම්බන්ධ ශික්ෂණ ව්‍යවහාරයන්හි දෙමව්පියන් නිරත කර ගැනීම.

3.4.4. පෙර පාසල් කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමේ දී හා අභිමතාර්ථ නිශ්චය කිරීමේ දී දෙමව්පියන් හා වෙනත් මූලික රැකවරණය සපයන්නන්, ගුරුවරුන් හා රාජ්‍ය නිලධාරීන් එක ම වේදිකාවකට ගැනීම සඳහා පෙර පාසල් සංවර්ධන කමිටු දිරි ගැන්වීම.

# 3.5 දත්ත, පර්යේෂණ, ඇගයීම හා ලේඛනගත කිරීම

## ප්‍රතිපත්ති 5:

ප්‍රතිපත්ති සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග, තිබෙන්නා වූ හොඳ ම සාක්ෂ්‍ය මත පදනම් විය යුතු අතර ප්‍රතිපත්තිවල හා භාවිතයන් හි ගුණාත්මකභාවයේ වර්ධනය අඛණ්ඩ ව වැඩි දියුණු කිරීමට සහාය වන්නක් විය යුතු වේ.

## උපායමාර්ග

3.5.1. පෙර පාසල් සඳහා අධ්‍යාපන කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම. අධ්‍යාපන කළමනාකරණ පද්ධතිය මධ්‍යගත ව හඳුන්වා දෙනු ලබන අතර පළාත් විසින් කළමනාකරණය කෙරේ. මෙහි මූලික අභිප්‍රාය වන්නේ ලියාපදිංචි කිරීම වැඩි දියුණු කිරීම, අධීක්ෂණය, විශ්ලේෂණය, සැලසුම්කරණය සහ තීරණ ගැනීම සඳහා දත්ත භාවිත කිරීම මෙන් ම විවිධ පළාත්වල ක්‍රියා පටිපාටි, දර්ශක හා දත්ත අතර එකමුතුවක් ඇති කිරීම ය.

3.5.2. සෑම වසර පහකට වරක් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික සමීක්ෂණයක් සිදු කිරීම.

3.5.3. පර්යේෂණ, ප්‍රතිපත්ති හා භාවිත අතර සබඳතාව ශක්තිමත් කිරීමට හා කුඩා ළමයින්ගේ ඉගෙනීම හා සංවර්ධනය සහ ශික්ෂණයන් පිළිබඳ පර්යේෂණ කිරීමට සහාය ලබා දීම සඳහා පර්යේෂණ ප්‍රතිපාදන ස්ථාපිත කිරීම.

5

ප්‍රතිපත්ති

3.5.4. ප්‍රතිපත්තිය මෙන් ම පෙර පාසල් අධ්‍යාපන සේවාවන් සහ අධ්‍යාපනික යටිතල පහසුකම් නව්‍යකරණය කිරීමට හා වැඩි දියුණු කිරීමට ද පර්යේෂණ හා ඇගයුම මෙන් ම ඒවා ප්‍රචලිත කිරීමට ද පහසුකම් සැලසීම.

3.5.5. ළමයින් සම්බන්ධ කර ගනිමින් සිදු කරන පර්යේෂණවල ආචාර ධර්ම රැකීම සඳහා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම හා පර්යේෂණය තුළ සිදු විය හැකි අවදානම සහ හානිය අවම වන බවට සහතික වනු පිණිස සහ ළමයින්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සහතික කරනු පිණිස අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.

3.5.6. ඉගැන්වීම හා ඉගෙනීම අඛණ්ඩ ව වර්ධනය වන සහයෝගිතාවයෙන් යුතු සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ජාතික මට්ටමින් සංවිධානය කරන ලද වෘත්තීයමය ඉගෙනුම් ප්‍රජාවක් පිහිටුවා ගැනීම.

## 3.6 පෙර පාසල් අධ්‍යාපනය පාලනය සහ මූල්‍ය සම්පත් භාවිතය

6

ප්‍රතිපත්ති

### ප්‍රතිපත්ති 6:

ඵලදායි හා වගකිව යුතු පාලනය සහ ජාතික හා පළාත් ආණ්ඩුවල අය-වැය ලේඛන පිළියෙල කිරීම ඇතුළත් සුසංයෝගී හා මනාව පෙළ ගැසුණු පද්ධතියක් තුළින් ළමයින්ගේ සහ ඔවුන්ට අධ්‍යාපනය සපයන්නන්ගේ අවශ්‍යතා සාධාරණ ලෙස ඉටු කිරීමට ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සහතික විය යුතු වේ.

### උපාය මාර්ග

3.6.1 ශ්‍රී ලංකාව තුළ සියලුම ළමයින්ට ගුණාත්මක බවින් යුතු පෙර පාසල් අධ්‍යාපනයකට ප්‍රවේශවීම සහතික කිරීම සඳහා "පෙර පාසල් පනත" හඳුන්වා දීමට පහසුකම් සැලසීම.

3.6.2 මුල් ළමාවිය සංවර්ධනය සහ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ජාතික වැඩසටහනට නායකත්වය සැපයීමේ බලතල සහිත ව, ළමා කටයුතු පිළිබඳ ජාතික අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ළමා ලේකම් කාර්යාලය, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවක් බවට පරිවර්තනය කිරීම.

3.6.3 පළාත් අධිකාරිවල කාර්යයන්, කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සම්පත් සැපයීම හා නීති රීති සමාන අයුරින් පවත්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

3.6.4 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ව්‍යුත්පන්න වූ ජාතික ආයතනවලට ඇති ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ හා ප්‍රමිති සැකසීමේ වගකීම ශක්තිමත් කිරීම හා විධිමත් කිරීම මෙන් ම සියලු පෙර පාසල්වල කළමනාකරණය හා අධීක්ෂණය පළාත් සභාවල වගකීම බවට සහතික කිරීම.

3.6.5 පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිණිස ජාතික සහ පළාත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.

3.6.6 තම කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා වැඩියෙන් ආයෝජනය කිරීමෙන් මුල් ළමා විය සංවර්ධනය සඳහා ජාතික හා පළාත් ආයතනවල ආයතනික සහ පුද්ගල ධාරිතාව ශක්තිමත් කිරීම.

3.6.7 ජාතික හා පළාත් මට්ටම් අතර හා පළාත් අතර බහු ආංශික ප්‍රතිපත්ති සැලසුම්කරණය ප්‍රවර්ධනය කිරීම සහ වැඩසටහන් සම්පාදන හා මූල්‍යන ප්‍රවාහයන් අතර කාර්යක්ෂමතාව, සම්බන්ධීකරණය හා පෙළගැස්ම සහතික කිරීම.

3.6.8 එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතන, බහු පාර්ශ්වීය සංවර්ධන බැංකු, පුද්ගලික අංශයේ කර්මාන්ත, පිළිගත් ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නො වන නියෝජිතායතන, ශාස්ත්‍රඥයින් සහ සිවිල් සමාජ සංවිධාන සමග හවුල්කාරීත්වය ඇති කර ගැනීම දිරි ගැන්වීම හා ඔවුන් වෙතින් උපදේශ සේවාවන් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

3.6.9 පොදු (ලාබ නොලබන සියලු දෙනාටම සැපයිය යුතු) භාණ්ඩයක් වශයෙන් සලකා අධ්‍යාපනයේ වැදගත්කම පිළිගෙන, ඵලදායී රාජ්‍ය අධීක්ෂණය හා නියාමනයට යටත් ව පෞද්ගලික අංශයේ සේවා සැපයීමේ කාර්යාභාරය දිරි ගැන්වීම සහ ඒ සඳහා සහාය ලබා දීම.

3.6.10 මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා දේශීය අරමුදල් සැපයීමට ප්‍රමුඛත්වය ලබා දී, එය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීම.

3.6.11 පළාත් අධිකාරී, කාර්යාංශ හෝ ඒකක විසින් මුල් ළමාවිය සංවර්ධනයට/මුල් ළමාවිය අධ්‍යාපනයට අදාළ මූල්‍යකරණ බෙදාහැරීමට හා එය භාවිත කිරීමට "ප්‍රගාමී විශ්වීය මූලධර්ම" යොදා ගැනීම.

3.6.12 පෙර පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා සාධාරණත්වය සහතික කිරීම පිණිස මූල්‍ය සම්පත් භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම.

3.6.13 අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය, ළමා ආරක්ෂණය, ජල කළමනාකරණය, සනීපාරක්ෂාව සහ සමාජ ආරක්ෂාව යන ක්ෂේත්‍ර හරහා ආයෝජන කිරීම.

3.6.14 පෙර පාසල් අධ්‍යාපනයේ පෞද්ගලික මූල්‍යකරණයේ උපපූරක කාර්යභාරය සඳහා පහසුකම් සැපයීම.

# 4. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව

මධ්‍යම ආණ්ඩුවේ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් පෙර පාසල් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පරිපාලනය කළ යුතු වේ. මෙම වගකීම ඉෂ්ට කිරීමට අත්‍යවශ්‍ය බලතල සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන අමාත්‍යාංශයට ලබා දිය යුතු ය.

මෙම ජාතික ප්‍රතිපත්තිය මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට දායක වන තේමා හා සම්බන්ධ ප්‍රතිපත්තියක් ලෙස සැලකිය යුතු වේ. ජාතික මට්ටමේ දී මුල් ළමාවිය සංවර්ධනය සහ රැකවරණය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතු ය.

ඒ අනුව, මෙම ප්‍රතිපත්තියේ ජීව ගුණය හා අභිප්‍රාය රැකෙන සේ ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලනය කිරීමේ දී මධ්‍යම රජයේ ළමා කටයුතු අමාත්‍යාංශයට අවශ්‍ය උපදෙස් සැපයීමට, මග පෙන්වීමට හා සහාය ලබා දීමට මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව විසින් මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් ස්ථාපිත කරනු ඇත.

මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුව පහත දැක්වෙන නිල ලත් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

- ළමා කටයුතු පිළිබඳ මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යංශ ලේකම් (සභාපති ලෙස කටයුතු කිරීමට)
- ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ලේකම් ලෙස කටයුතු කිරීමට)
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති හෝ සභාපතිතුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නිලධාරියෙකු
- මුදල් කොමිෂන් සභාවේ සභාපති හෝ සභාපතිතුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නිලධාරියෙකු
- පහත දැක්වෙන විෂය භාර මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශ ලේකම්වරු හෝ ලේකම්වරුන් විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයින්
  - අධ්‍යාපන
  - මුදල්
  - සෞඛ්‍ය
  - සමාජ සේවා සහ
  - පළාත් සභා

- මුල් ළමාවිය සංවර්ධනය/පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පළාත් නියාමන අධිකාරි/කාර්යාංශ/ඒකක අධ්‍යක්ෂවරුන් හෝ පළාත් ප්‍රධාන ලේකම්තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයින්

- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයෙක්

- වතු මානව සම්පත් භාරයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයෙක්

මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටු ලේකම් කාර්යාලය ලෙස ළමා ලේකම් කාර්යාලය කටයුතු කරනු ඇත.

මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවට අවශ්‍ය පරිදි ආංශික විශේෂඥයින්ගේ සේවා කමිටු හෝ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වනු පිණිස ක්‍රියාකාරී කමිටු හෝ පත් කරනු ඇත.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව විසින් මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවේ පූර්ණ බලතල, යොමු කිරීමේ අනුදේශ මගින් ස්ථාපිත කරනු ඇත.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිස පෙර පාසල් අධ්‍යාපනය සඳහා ආංශික සැලසුමක්, මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුව මගින් සකස් කරනු ඇත. ආංශික සැලසුම මගින් මෙම ප්‍රතිපත්තියෙහි සඳහන් සියලුම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වගකීම දරන ආයතනය හා ඊට සහාය වන ආයතන හඳුනා ගැනීම, ඒවා ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව, ආයෝජන සැලැස්ම, අභිමත ප්‍රතිඵල සහ ප්‍රගතිය පෙන්වන මූලික දර්ශක, පාදක මට්ටම හා ඉලක්ක හඳුනා ගනු ඇත.

මෙම ආංශික සැලැස්ම ස්ථිර කාල පරාසයකට අනුව නැවත සලකා බලා ගැළපෙන සේ යාවත්කාලීන කෙරෙනු ඇත.

පළාත් අධිකාරි කාර්යාංශ හෝ ඒකකයන්ගේ රාජකාරි හා වගකීම් ඉටු කිරීමට අදාළ ව නිරීක්ෂණය කළ හැකි වෙනස්කම් පවතින බැවින්, සියලු පළාත් මගින් පොදු දැක්මක් සහ පොදු ජාතික ආංශික සැලැස්මකින් මග පෙන්වනු ලබන පොදු හා නො වෙනස් වන ප්‍රමිති හා නියාමන විධිවිධාන මෙන් ම අධීක්ෂණය සඳහා වන ක්‍රම යොදා ගත යුතු බවට මෙම ප්‍රතිපත්තිය මගින් නිර්දේශ කෙරේ.

එමෙන් ම නවෝත්පාදනයට හා වැඩි දියුණු කිරීමට පළාත් නියාමන බලධරයන් සතු විභවතාව මෙම ප්‍රතිපත්තිය විසින් පිළිගනු හා දිරි ගන්වනු ලබන අතර, පෙර පාසල් අධ්‍යාපනය අධීක්ෂණය සහ කළමනාකරණය කිරීමට අදාළ පළාත් මට්ටමින් සංවර්ධනය කරන ලද නව තාක්ෂණ හා ප්‍රවේශ පුළුල් කිරීමට සහාය ලබා දීමට ද කැප වී සිටී.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී පළාත් බලධාරීන් මගින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- ආංශික සැලැස්මට අනුරූප ව කාල රාමුවක් සහිතව ක්‍රියාත්මක කිරීමේ පළාත් සැලසුම් සකස් කිරීම.
- ප්‍රතිපත්ති නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශාත්මක සේවාවන් ලබා දීමට සහ මගපෙන්වීමට අවශ්‍ය පරිදි පළාත් මට්ටමින් තාක්ෂණ කමිටු පත් කිරීම.
- ආංශික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මගපෙන්වීමට පළාත් මට්ටමින් ස්ථාපිත කෙරෙන ඕනෑම සම්බන්ධීකරණ කමිටුවක් සඳහා මධ්‍යම ආණ්ඩුවේ ළමා කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු ඇතුළත් කිරීම.
- ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පළාත් සැලසුම් ක්‍රියාවට නැංවීමේ දී ඒ සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ සහ එහි තත්ත්වය පිළිබඳ ව මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුව හරහා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කිරීම.

# ඇමුණුම්



## ඇමුණුම 1 : පාරිභාෂික පද මාලාව හා අර්ථ දැක්වීම්

### ළමයා

ළමයින් හා තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥාපනත ප්‍රකාර ව ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18ට අඩු පුද්ගලයකු ළමයකු ලෙස අර්ථ දැක්වේ.

### ළමා කේන්ද්‍රීය[9]

අධ්‍යාපන හා සුරැකුම් සේවාවලට අදාළ අධ්‍යාපනික වැඩසටහනක් සකස් කිරීම සඳහා පදනම ලෙස එක් එක් ළමයාගේ වර්තමාන දැනුම, ශක්තීන්, සංස්කෘතිය, හැකියාවන් සහ කැමති අකමැති දෑ පිළිබඳ සලකා බැලීම.

### සංවර්ධනයට යෝග්‍ය භාවිත[10]

සෑම ළමයකුගේ ම ප්‍රශස්ත සංවර්ධනය, ප්‍රවර්ධනය කිරීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපනිකයින් සහ වෙනත් වෘත්තිකයන් චේතනාන්විත ව ගනු ලබන තීරණවල ප්‍රතිඵලයකි. මෙම තීරණ 1) සංවේදී, සාධාරණ ඉගෙනුම් ප්‍රජාවක් නිර්මාණය කිරීම 2) පවුල් සහ ප්‍රජාවන් සමග ගෞරවනීය, අන්‍යෝන්‍ය වශයෙන් සහායවන පාර්ශ්වකරුවන් ලෙස කටයුතු කිරීම 3) ළමයින්ගේ සංවර්ධනය හා ඉගෙනුම නිරීක්ෂණය කිරීම, ලේඛනගත කිරීම හා තක්සේරු කිරීම 4) සෑම ළමයකුගේ ම සංවර්ධනය හා ඉගෙනුම වැඩි දියුණු කිරීම සඳහා ඉගැන්වීම 5) අර්ථාන්විත ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා ළමයින් නිරත කෙරෙන විෂයමාලාවක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම යන පුළුල් කාණ්ඩවලට බෙදිය හැකිය.

### සක්‍රීය පරිසර[11]

මුල් ළමාවියේ දී සියලු ළමයින්ට, තම සංස්කෘතීන්ට සහ ප්‍රජාවට අදාළ උත්තේජන සහිත සම්පත්, ක්‍රීඩා සහ විනෝදාත්මක ඉගැන්වීම් තුළින් අනගි ඉගෙනුම් අවස්ථා සහ අවදානම් ගැනීමට හා ගවේශණයට සහාය, සක්‍රීය පරිසර මගින් ලබා දේ.

9 *Australian Children's Education and Care Quality Authority, Guide to the National Quality Framework (Sydney, 2018).*

10 *National Association for the Education of Young Children, "NAEYC Position Statement on Developmentally Appropriate Practice: 2019", Washington, D.C., 2019.*

11 *Early Education, Development Matters in the Early Years Foundation Stage (EYFS) (London, 2012).*

ඇමුණුම

## සාධාරණ ප්‍රවේශය

තම තත්ත්වය කුමක් වුවත් ශ්‍රී ලංකාවේ සෑම පෙර පාසල් වයසේ දරුවකුට ම පෙර පාසල් අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාව ලබා දීම.

## උසස් තත්ත්වයේ පෙර පාසල් වැඩසටහන්

උසස් තත්ත්වයේ පෙර පාසල් වැඩසටහනක් මගින් කුඩා ළමයින්ට ආරක්ෂිත සහ සංවේදී රැකවරණයකින් යුතු පරිසරයක් සපයනු ලබන අතර ඔවුන්ගේ ශාරීරික, සාමාජයීය, චිත්තවේගී හා බුද්ධි වර්ධනය ප්‍රවර්ධනය කෙරේ. ඊට අදාළ වැඩසටහන් (අන්තර් ක්‍රියාවන්, ක්‍රියාකාරකම්, ද්‍රව්‍ය, ඉගෙනුම් අවස්ථා හා සෞඛ්‍ය සහ ආරක්ෂිත දින චර්යාවන් සහ ව්‍යුහය එනම් එක් එක් ළමයින්ගේ කණ්ඩායමේ ප්‍රමාණය, වැඩිහිටි-ළමා අනුපාතය හා ගුරුවර ගුරුවරියන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනය හා පුහුණුව) අනුව ඇගයීමට ලක් කෙරේ.

## සාකල්‍ය සංවර්ධනය[12]

සාකල්‍ය ප්‍රවේශය තුළ ළමයාගේ ශාරීරික, පුද්ගලික, සාමාජයීය, චිත්තවේගී හා ආධ්‍යාත්මික යහ පැවැත්ම මෙන් ම ඉගෙනීමේ ප්‍රජානන අංශය වෙත ද අවධානය යොමු කෙරේ.

## වඩාත් අවදානමට ලක් විය හැකි හා අඩු පහසුකම් සහිත ළමයින්

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවේ මුල් ළමාවියෙහි ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම: පොදු පැහැදිලි කිරීම අංක 7 (2005) ට අනුව වඩාත් අවදානමට ලක් විය හැකි ළමයින් ගැහැනු ළමයින්, දිළිඳු ළමයින්, ආබාධ සහිත ළමයින්, ස්වදේශික හෝ සුළු ජාතික ගණයට කණ්ඩායම්වලට අයත් ළමයින්, සංක්‍රමණික පවුල්වල ළමයින්, අනාථ දරුවන් හෝ වෙනත් හේතූන් නිසා දෙමව්පිය රැකවරණය අහිමි වූ ළමයින්, ආයතනගත ළමයින්, බන්ධනාගාර තුළ මව්වරුන් සමග ජීවත් වන ළමයින්, සරණාගත හා ආරක්ෂස්ථාන අවශ්‍ය ළමයින්, එච්.අයි.වී/ඒඩ්ස් ආසාදිත හෝ එහි බලපෑමට ලක් වූ ළමයින් සහ මත්පැන් හෝ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දෙමව්පියන්ගේ ළමයින් අයත් වේ.

## පෙර පාසල් වයසේ ළමයින්

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වයසේ ළමයින් ලෙස සලකනු ලබන්නේ වයස අවුරුදු තුනේ සිට පහ දක්වා වයසේ පසු වන ළමයින් ය.

## පෙර පාසල් අධ්‍යාපනය හෝ මුල් ළමාවිය අධ්‍යාපනය[13]

පෙර පාසල් අධ්‍යාපනය හෝ මුල් ළමාවිය අධ්‍යාපනය මගින් මුල් ළමාවියට අයත් ළමයින්ගේ ප්‍රජානන, කායික, සමාජයීය, චිත්තවේගීය හා භාෂා සංවර්ධනය සඳහා සාකල්‍ය ප්‍රවේශයක් සහිත ව ඉගෙනුම් හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් සපයනු ලබන අතර කුඩා ළමයින්ට ශාස්ත්‍රීය කාර්යයන් සඳහා සූදානම් වීමට අවශ්‍ය ඇතැම් කුසලතාවන් වර්ධනය කර ගැනීමට හා ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශය සඳහා සූදානම් කිරීමට පවුලෙන් පිටත සංවිධිත උපදෙස් හඳුන්වා දෙනු ලැබේ.

---

12 *Commonwealth of Australia, Department of Education and Training, Belonging, Being & Becoming: The Early Years Learning Framework for Australia (2009).*

13 *UNESCO Institute for Statistics, Glossary. Available at http://uis.unesco.org/en/glossary (accessed on 10 July 2019).*

## පෙර පාසල් අධ්‍යාපන ශ්‍රම බලකාය

ගුරුවර ගුරුවරියන්, ගුරු සහකාරවරුන්, මුල් ළමාවිය සංවර්ධනය/ පෙර පාසල් අධ්‍යාපනය සඳහා වන ජාතික හා පළාත් අධිකාරීන්/ කාර්යාංශ/ඒකකවල රාජ්‍ය නිලධාරීන් සහ ජාතික හා උප ජාතික මට්ටමින් ළමයින් සඳහා සේවය සපයන නියෝජිතායතනවල රාජ්‍ය නිලධාරීන්ගෙන් පෙර පාසල් අධ්‍යාපනයේ ශ්‍රම බලකාය සමන්විත වේ.

## ප්‍රගාමි විශ්වවාදය[14]

ප්‍රගාමි විශ්වවාදය යනු දිළිඳු හා අඩු පහසුකම් සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා කෙරෙහි ප්‍රමුඛතාව දක්වමින් ගුණාත්මකභාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබා දීමේ කාර්යය පුළුල් කිරීම යි. රාජ්‍ය අරමුදල් හිඟ බව හඳුනා ගනිමින් මුදල් වැය කිරීම පිළිබඳ තීරණ දැනුම් දීම සඳහා එමගින් මග පෙන්වීමේ මූලධර්ම සපයනු ලැබේ.

# ඇමුණුම 2 : ජාතික පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෙම ප්‍රතිපත්ති ලේඛනය පහත නම් සඳහන් හය දෙනෙකුගෙන් සමන්විත කෙටුම්පත් කමිටුවක සහාය ඇතිව සකස් කරන ලදි.

| | |
|---|---|
| **ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතා** | උප සභාපති - (ප්‍රතිපත්ති), ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| **මහාචාර්ය එල්සි කොතලාවල මහත්මිය** | විශ්‍රාමික, මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **ආචාර්ය ඉන්ද්‍රානි තලගල මහත්මිය** | හිටපු අංශාධිපතිනිය, මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **නයනා සේනාරත්න මහත්මිය** | අධ්‍යක්ෂ, ළමා ලේකම් කාර්යාලය, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය |
| **රසික සෝමවීර මහතා** | අධ්‍යාපන නිලධාරී, යුනිසෙෆ් ශ්‍රී ලංකා ආයතනය |
| **අචලා දමයන්ති මහත්මිය** | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති සැලසුම්), ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |

14 *The International Commission on Financing Global Education Opportunity, The Learning Generation: Investing in Education for a Changing World (2016).*

# ප්‍රතිපත්ති කෙටුම්පත් කමිටු උපදේශනය

මෙම ජාතික ප්‍රතිපත්තිය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කරන ලද්දේ පර්යේෂණ, ආංශික නාභිගත සම්මුඛ සාකච්ඡා සහ විශේෂඥයින්, පර්යේෂකයින්, මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයින්, රජයේ නිලධාරීන්, පරිපාලකයින් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවල නිලධාරීන්, ජාතික සහ අන්තර්ජාතික ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත ක්ෂේත්‍රය මැනවින් නියෝජනය කරන කණ්ඩායම් යනාදියෙහි අදහස් හා නිර්දේශ මත පදනම්වය.

ඒ සඳහා පහත ලැයිස්තුගත කර ඇති ආයතනවල ක්‍රියාකාරීන් සහ නිලධාරීන් මුණගැසීමෙන් ද කරුණු එකතු කරන ලදී.

- අධ්‍යාපන අමාත්‍යාංශය
- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය
- ළමා ලේකම් කාර්යාලය
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- ජාතික අධ්‍යාපන ආයතනය
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
- පළාත් නියාමන අධිකාරීන්
- සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය
- ජාතික ළමා අධ්‍යාපන පදනම
- වැවිලි මානව සංවර්ධන භාරය
- පෙර පාසල් පවත්වන්නන්ගේ සහ ගුරු පුහුණුව කරනු ලබන නියෝජිතයන්
- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල්වල සාමාජිකයින්
- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් සංවිධානයේ සාමාජිකයින්
- සේව් ද චිල්ඩ්රන් ආයතනය
- යුනිසෙෆ් ශ්‍රී ලංකා ආයතනය
- වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය
- පෙර පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්

## ඇමුණුම 3 : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින්

සම්මානනීය මහාචාර්ය ඩබ්ලිව්. අයි. සිරිවීර මහතා, - සභාපති

ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතා - උප සභාපති (ප්‍රතිපත්ති)

ආචාර්ය ටී. ඒ. පියසිරි මහතා - උප සභාපති (සැලසුම්)

පූජ්‍ය ආචාර්ය අකුරටියේ නන්ද නායක ස්වාමින් වහන්සේ

මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා

මහාචාර්ය දයන්ත විජේසේකර මහතා

මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා

මහාචාර්ය කේ. කන්දසාමි මහතා

මහාචාර්ය එම්. ඒ. නුහ්මාන් මහතා

මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ මහතා

ආචාර්ය එස්. බී. ඒකනායක මහතා

ආචාර්ය මල්ලිකා කරුණාරත්න මිය

ඒ. එන්. හපුගල මහතා

නයනා නාතවිතාරණ මිය

වී. බී. පී. කේ. වීරසිංහ මිය

එච්. ජී. අප්සරා කල්දේරා මිය
කොමිෂන් සභාවේ ලේකම්

## ඇමුණුම 4 : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයන්

ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතා - සභාපති

සම්මානනීය මහාචාර්ය ඩබ්ලිව්. අයි. සිරිවීර මහතා

ආචාර්ය ටී. ඒ. පියසිරි මහතා

පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක ස්වාමින් වහන්සේ

පූජ්‍ය මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඥානරතන ස්වාමින් වහන්සේ

ගරු දුෂන්ත රොඩ්රිගෝ පියතුමා

මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා

මහාචාර්ය හුසේන් ඉස්මයිල් මහතා

මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා

මහාචාර්ය ඩී.ඒ. තන්ත්‍රිගොඩ මහතා

මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා

ආචාර්ය මල්ලිකා කරුණාරත්න මිය

වෛද්‍ය හිරන්ති විජේමාන්න මිය

වෛද්‍ය දියනාත් සමරසිංහ මහතා

ආචාර්ය එස්. බී. ඒකනායක මහතා

ආචාර්ය ජයන්ති ගුණසේකර මිය

ආචාර්ය මධුරා වෙහැල්ල මිය

වෛද්‍ය අජිත් අමරසිංහ මහතා

ආචාර්ය උපාලි මාම්පිටිය මහතා

ප්‍රිතිවිරාජ් පෙරේරා මහතා

සිසිර මල්ලවාරච්චි මහතා

එස්. කුරුප්පුආරච්චි මහතා

ගයාත්‍රි අබේගුණසේකර මිය

ඩබ්ලිව්. ඩී. එල්. සෞභාග්‍යා මිය

එස්. ආර්. තෙන්නකෝන් මිය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ, ශ්‍රී ලංකාව
**www.nec.gov.lk**